විදේශ අමාත්‍යාංශය

வெளிநாட்டு அமைச்சு

# FOREIGN MINISTRY

ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1, ශ්‍රී ලංකාව, குடியரசு கட்டிடம், கொழும்பு 1, Republic Building, Colombo 1, Sri Lanka

මගේ අංකය / எனது இல / My No

ඔබේ අංකය / உமது இல / Your No

දිනය / திகதி / Date

## ගරු විදේශ අමාත්‍යවරයාගේ නිදහස් දින පණිවුඩය

සියවස් හතරහමාරක කාලයක් මුළුල්ලේ පැවති විදේශීය යටත් විජිත පාලනයෙන් මිදී නිදහස හිමිකර ගත් ශ්‍රී ලංකාව, සිය 74 වැනි නිදහස් සංවත්සරය සනිටුහන් කරමින් ජාතික දිනය සමරන මෙම ප්‍රීතිමත් අවස්ථාවේ දී, ශ්‍රී ලංකාවේ මෙන්ම ලොව පුරා විවිධ ප්‍රදේශවල විසිර පැතිර සිටින ශ්‍රී ලාංකික පුරවැසියන් වෙත මාගේ උණුසුම් හා හෘදයාංගම සුබපැතුම් පළ කර සිටින්නේ ඉමහත් අභිමානයෙන් සහ ප්‍රීතියෙනි.

දේශපාලනික, ආර්ථික සහ සමාජ-සංස්කෘතික යනාදී වශයෙන් එල්ල වූ බලපෑම්වලින් මිදී, අපගේ ජනතාවට නිදහස සහ ඔවුන්ගේ අන්සතු කළ නොහැකි අයිතිවාසිකම් යළි ලබාගැනීම පිණිස, ජාතියක් වශයෙන් අප පැමිණි ගමන අද දින සමරන්නෙමු. මාතෘභූමියට නිදහස ලබාගැනීම සඳහා අපගේ නිර්භීත මුතුන් මිත්තන් කළ කැපවීම, පරිත්‍යාගය, අධිෂ්ඨානය සහ අරගලය අපි ගෞරවයෙන් හා කෘතඥතා පූර්වකව සිහිපත් කරන්නෙමු.

1948 වසරේ පෙබරවාරි 4 වැනි දින අප ලැබූ නිදහස ඔස්සේ මෙරට ජනතාව තුළ දේශපාලනික, ආර්ථික සහ සමාජ - සංස්කෘතික පරිවර්තනයක් ඇති කිරීමට හැකියාව ලැබිණි. නිදහස හිමි කරගැනීමෙන් අනතුරුව, විශේෂයෙන්ම විශ්වීය සාක්ෂරතාව ආසන්න වශයෙන් සාක්ෂාත් කරගැනීම මෙන්ම, සෞඛ්‍ය සම්පන්න සමාජයක් බිහි කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සැලකිය යුතු ආකාරයේ ජයග්‍රහණ ලබා ඇත. අවම ළදරු මරණ අනුපාතයකට හිමිකම් කීම, ජනතාවගේ ආයු කාලය ඉහළ නැංවීම යනාදිය හරහා මෙම සාර්ථකත්වය විද්‍යාමාන වන අතර, මෙතෙක් බලයට පත් වූ රජයන් විසින් ජනතාවට සැලසූ නිදහස් අධ්‍යාපනය සහ නිදහස් මහජන සෞඛ්‍ය සේවා මගින් ඒ සඳහා සෘජු දායකත්වයක් සපයා ඇත. කෙසේ වුවද, ලේ වැගිරවීම් සිදු වූ කැරලි දෙකක් සහ අධික ලෙස පාඩු සිදුකරමින් ආසන්න වශයෙන් දශක තුනක් මුළුල්ලේ රට අභ්‍යන්තරයේ ක්‍රියාත්මක වී 2009 වසරේ මැයි මස නිමාවට පත් වූ අභියෝගාත්මක සන්නද්ධ යුද ගැටුම් ඇතුළු ඉතා දුෂ්කර අභියෝග රැසකට ජාතියක් වශයෙන් අපට මුහුණ දීමට සිදු වූ බව සඳහන් කළ යුතු ය. විදේශීය යටත් විජිත පාලනයට එරෙහිව සටන් කළ අපගේ සියලුම ජාතික විරුවන්ට සහ ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාව සහ ජාතික සමගිය සුරක්ෂිත කිරීම සඳහා උත්තරීතර පරිත්‍යාගයක් සිදු කළ ත්‍රිවිධ හමුදාවේ, පොලිස් සේවයේ සහ සිවිල් ආරක්ෂක සේවයේ නියුතු අභීත නිලධාරීන්ට මෙම සුවිශේෂී දිනයේ දී අපි නිහතමානීව හිස නමා ආචාර කරන්නෙමු.

වර්තමානයේ දී සමස්ත ලෝකයම පීඩාවට පත් කර ඇති ගෝලීය කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අද අප සිටින්නේ තීරණාත්මක සන්ධිස්ථානයක් අභියස ය. එබැවින්, එහි අහිතකර බලපෑම්වලින් මිදීම සඳහා සියලුම ශ්‍රී ලාංකිකයන් නැවත වරක් වෙහෙස වී කටයුතු කිරීම සඳහා කැපවිය යුතු ය. මෙම වසංගතය විශේෂයෙන්ම ශ්‍රී ලංකාව ඇතුළුව සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථිකයට මෙන්ම, අඩු ආදායම්ලාභී ජන කොට්ඨාශවල ජනජීවිතවලට දැඩි හා අසමාන අයුරින් බලපෑම් එල්ල කොට ඇත. එබැවින්, වසංගතය පරාජය කොට ආර්ථිකය නගා සිටුවීමට රජය දරන පරිශ්‍රමයට සහය වීම සඳහා මෙරට මෙන්ම විදේශ රටවල වෙසෙන සියලුම ශ්‍රී ලාංකිකයන් එකමුතු වී සිය සහයෝගය ලබා දීම අත්‍යවශ්‍ය බව මම විශ්වාස කරමි.

74 වැනි නිදහස් සංවත්සරය සමරන මේ මොහොතේ දී, 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති රාමුව යටතේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ රජයේ ප්‍රතිඥා ඉටු කරන අතරතුර ලොව සියලු රටවල් සමඟ මිත්‍රශීලී සබඳතා පවත්වමින් සාමකාමී සහ සමෘද්ධිමත් ජාතියක් ගොඩනැගීම සඳහා අපි අදිටන් කර ගෙන සිටිමු.

මහාචාර්ය ජී. එල්. පීරිස්, පා.ම.
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විදේශ අමාත්‍ය

දුරකථන / தொலைபேசி / Telephone 2325372 2325375
ෆැක්ස් / பெக்ஸ் / Fax 2333450 2446091 2430220
ඊමේල් / மின்அஞ்சல் / E-Mail cypher@mfa.gov.lk
වෙබ් අඩවිය / இணைய தளம் / Web site www.mfa.gov.lk